පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන
මාධ්‍ය ඒකකය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

දෙවන කලාපය
ජූලි - 2007

# vikalpa
# විකල්ප
# மாற்று வழி

## පුරවැසි ජනමාධ්‍ය ගැන පළමුවෙනි එක්දින වැඩමුළුව මීගමුවේදී.....

### අද නං සොරිම තමයි....

අපි කට්ටියම නිදි අපේ සෙන්ටර් එකේ. දනට මාස දෙකකට විතර ඉහතදි. එක පාරටම සද්දයක් ආවා. ඩුම්.....මම බැලුවා වෙලාව...රෑ 12ත් පහුවෙලා. ආයෙමත් ආවා අර සද්දෙ....ඩුම්.....අපි දැම්ම ගුවන්විදුලි යන්ත්‍රය. මේ වෙන කොට අපේ සෙන්ටර් එකේ කසුකුසුව..කෙනෙක් කිව්වා කටුනායක එයාපෝට් එකට කොටි ගහනවා කියලා. එහෙන් මෙහෙන් ප්ලේන් යනවා ඇ-හෙනවා. මම ගැහෙනවා දඩ දඩ ගාලා. මොකද මම ටැමිල්නෙ...අපේ අය කතා කළා හදිසි ඇමතුම් අංශයට. එහෙන් කිව්වා කතාව ඇත්ත එයාපෝට් එකට ගහනවා කියලා. ඒ එක්කම බයික් එකක් යනවා ඇහුණා මහා සද්දෙං..රූං ගාලා. මම තවත් බය වුණා. මම කට්ටියට කිව්වා අදනං සොරිම තමයි කියලා. එදායින් ඒ ප්‍රශ්නෙ ඉවරයි...ඒත් අපේ අය අදටත් මාව දැක්කම විහිලු කරනවා අදනං සොරිම තමයි කියලා.....

*ගාමිණී වීරකෝන්.*
*මීගමුව*

*පුරවැසි ජනමාධ්‍ය ගැන මේ වැඩමුළුවට සහභාගි වීම මට හොඳ අත්දැකීමක් වුණා. සාමාන්‍ය මිනිස්සුන්ට තමන්ගෙ ප්‍රශ්න, අත්දැකීම්, අදහස් උදහස් ආදිය පළ කරන්න විකල්ප නමින් වෙබ් අඩවියක් තියෙන බව දැනගත්තා. ඒක අපිට ඉතාම හොඳ ආරංචියක්. ohmyNews වගේ පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි ගැන අපි අහලා තියෙනවා. විකල්පත් ඒ වගේ සාර්ථක වේවි කියා හිතනවා. විකල්ප ට දිගටම ලිපි විශේෂාංග එවන අයට පහසුකම් සැලසිය හැකි නම් හොඳයි..*

***එම්. සාජහන්***
***වැඩමුළුවට සහභාගි වූ කෙනෙක්.***



වැඩමුළුව පැවැත්වෙන අතරතුරේදී .....

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකය මගින් දියත් කෙරෙන පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන යටතේ රටේ තෝරාගත් විවිධ ප්‍රදේශවල පැවැත්වීමට සැලසුම් කර ඇති පුරවැසි ජනමාධ්‍ය වැඩමුළු මාලාවේ පළමුවැන්න 2007 අගෝස්තු 15 වන දින මීගමුවේදී පැවැත්වුණා. ඉහත දැක්වෙන්නෙ ඒ වැ-ඩමුළුවේදී ලියවුණු කතාවක්.

මී පුර ප්‍රාදේශීය පුවත්පත සමග සම්න්ධන්ධ වී සිටින සාමාජික සාමාජිකාවන් සහ ජනාවබෝධ කේන්ද්‍රයට සම්බන්ධ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකුත් මේ වැඩමුළුවට සහභාගි වුණා. අපේ සමාජයේ ඈත අතීතයේ සිටම භාවිතා වෙන පුරවැසි මත පළ කිරීමේ විවිධ මාධ්‍ය පිළිබඳව විමසා බලමින් අන්තර්ජාල වෙබ් අඩවි දක්වා ඒවා වර්ධනයවී ඇති ආකාරයත්, පුරවැසි ජනමාධ්‍ය භාවිතයේ ඇති බලපෑම් සහගත බවත් සාකච්ඡා කරමින් පවත්වන ලද මේ වැ-ඩමුළුවේදි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට වැඩි අවධාරණයක් ලබා දී තිබුණා. වැඩමුළුව මෙහෙයවූයේ ප්‍රවීණ මාධ්‍යවේදියෙකු වන සී දොඩාවත්ත මහතායි.

මෙයට සහභාගි වූ බහුතරක් දෙනා පසුගිය දින කීපය පුරාම තැපැලෙන් සහ ෆැක්ස් මගින් විකල්ප වෙබ් අඩවියේ පළ කිරීම සඳහා අප වෙත කතා එව්වා. ප්‍රායෝගිකව පුරවැසි ජනමාධ්‍යයේ නියැලෙන සුළු පිරිසක් හෝ ගම් මට්ටමින් බිහි කර ගැනීමේ අරමුණ ඇතිව පවත්වන ලද වැඩමුළුව සාර්ථක වූ බවට එය සාක්ෂියක්.

ඔබට විකල්ප වෙබ් අඩවියට පිවිස ඔවුන් ලියා එවූ කතා කියවිය හැකියි.

(පුරවැසි ජනමාධ්‍ය සම්බන්ධයෙන් පුරෝගාමියෙකු වන ඩැන් ගිල්මෝ ගේ මූලිකත්වයෙන් සකස් කොට ඇති පුරවැසි ජනමාධ්‍ය මූලධර්ම මාලාව ඇසුරෙනි)

www.kcnn.org/principles/



# පුරවැසි ජනමාධ්‍ය මූලධර්ම

## නිරවද්‍යතාව

යහපත් ජනමාධ්‍යවේදයේ පිවිසුම් දොර නිරවද්‍යතාවයයි. පුරවැසි ජනමාධ්‍යයේද ප්‍රමුඛතම මූලධර්මය එයයි. පුරවැසි වාර්තාකරුවා තමා වෙත ලැබෙන තොරතුරුවල නිවැරදි බව නැවත නැවත පරීක්ෂා කළ යුතුයි. ප්‍රබන්ධයෙන් සත්‍යය වෙන් කොට හඳුනා ගැනීම මෙහිදී අතිශයින්ම වැදගත් වෙයි. ඒ සඳහා කුමන මූලාශ්‍ර වෙත ප්‍රවේශ විය යුතුදැයි වාර්තාකරු බුද්ධිමත්ව තීරණය කළ යුතු වෙයි.

වෙබ් අඩවියකට ලියන පුරවැසි වාර්තාකරුවා සිදුවීමකට අදාළව තමන් දන්නේ මොනවාද කියා මෙන්ම නොදන්නේ මොනවාද කියාත් ලිවීම වැදගත්ය. එවිට දැනුවත් පාඨකයන්ට එම අඩු තැන් සම්පූර්ණකරමින් සාකච්ඡාවකට එළඹිය හැකියි.

තම ලිපියේ ඇතුළත් වූ නම් ගම් හෝ වෙනත් තොරතුරක් වැරදි යැයි දැනගත් වහාම ඒ ගැන කණගාටුව පළ කර නිදොස් කිරීමක් කිරීම ද මේ නිවැරදිභාවය යන මූලධර්මයටම අයත්ය.

## සුපරීක්ෂාකාරී ගවේශණය

හුදු අනුමානයෙන් දක්වීම සහ ස්ථිරසාරව යමක් වාර්තා කිරීම අතර ඇති වෙනස කුමක්ද? එහෙන් මෙහෙන් ලැබෙන ආරංචි සහ සැබෑ තොරතුරු ගැඹුරින් විමසා බැලීම අතර ඇති වෙනස කුමක්ද?

පුරවැසි වාර්තාකරුවා නිරන්තරයෙන්ම මේ ගැන අවදියෙන් සිටිය යුතුයි.

සුපරික්ෂාකාරී ගවේශණය යන මූලධර්මයෙහි පිහිටා සිටීම මෙහිදී අතිශයින් වැදගත් වෙයි.

තමන් ලියන්නට යන මාතෘකාවට අදාළව විවිධ මූලාශ්‍ර වෙතින් හැකි තරම් තොරතුරු සොයා බැලීම වෘත්තීය වාර්තාකරුවෙකුගෙන් අපේක්ෂා කෙරෙන යහ ගුණාංගයකි. සොයා ගන්නා සියලුම දේ ලිපියේ ඇතුළත් කරන්නේ නැති විය හැකියි. නමුත් විශාල හිස්තැන් සහ අපැහැදිලි තැන් ඉතිරි කරනවාට වඩා වැඩිපුර තොරතුරු ගවේශණය කිරීමට කාලය සහ ශ්‍රමය වැයකිරීම වටිනේය. වගකීම් සහගත වැර්තාකරුවා හැමවිටම ''මම මේ සම්බන්ධයෙන් කතා කළ යුත්තේ තව කාටද'' යි තමාගෙන්ම විමසයි.

වෙබ් අඩවියකට ලියන පුරවැසි වාර්තාකරුවාට අදාළ සිදුවීම පිළිබඳ තවදුරටත් තොරතුරු එක් කරන ලෙස පාඨකයන්ගෙන් ද ඉල්ලා සිටිය හැකියි.

## සාධාරණබව

සාධාරණබව යහපත් ජනමාධ්‍යවේදයේ අනිවාර්ය ගුණාංගයකි. වාර්තාවක් ලිවීමේදීත්, තමන්ගේ මතයේ පිහිටා සිටිමින් යම් සංසිද්ධියක් පිළිබඳ තර්ක කිරීමේදීත් තමන් විශ්වාස කරන දේ මතු කිරීම වෙනුවෙන් කරුණු එක් පැත්තකට බර කළහොත් හෝ කෘත්‍රිම ලෙස විරුද්ධ මත ඇතුල් කළහොත් හෝ එය පාඨකයන්ව රැවටීමක් වෙනු ඇත.

තමන් ලියූ දෙයට විරුද්ධව හෝ එකඟව පාඨකයන් ලබා දෙන ප්‍රතිචාර සාවධානව සලකා බැලීම ද විවිධ වූ මතයන් මැදහත් සිතින් කිරා මැන බැලීමද සාධාරණ බවේම කොටසකි. යම් සිදුවීමක් පිළිබඳව සොයා දනගන්නා තොරතුරු විශාල වශයෙන් එක් පාර්ශවයක මතය සනාථ කරන බව පෙනෙන අවස්ථාවලදී ව්‍යාජ සමබර බවක් පෙන්වීමට කරුණු සැඟවීම හෝ විකෘති කිරීම හෝ පදනම් විරහිතව විරුද්ධ  පාර්ශවයන් නගන තර්ක  අතිශයෝක්තියෙන් උපුටා දක්වීම හෝ පුරවැසි වාර්තා කරුවන් කිසිවිටෙකත් නොකළ යුත්තකි.

කෙසේ කීවද සාධාරණබව ඉස්මතු වන්නේ වාර්තාකරුවාගේ මති මතාන්තර වල බලපෑමෙනි. එනිසා යමක් පිළිබඳ වාර්තාකිරීමේදී එසේ කිරීම සඳහා තමන්ව මෙහෙයවන්නේ කුමක් විසින්ද යන්න පිළිබඳව පුරවැසි වාර්තාකරුවා නිරන්තර අවධානයෙන් පසුවිය යුතුයි. තමන් කියන දෙයට එකඟ වන්නන්ට වඩා විරුද්ධ වන්නන්ට ඇහුම්කන් දීම මෙහිදී වඩාත් වැදගත් වෙයි.

## පාරදෘශ්‍යභාවය

මේ වනාහි පුරවැසි වාර්තාකරුවන් පිළිපැදිය යුතු ප්‍රධාන මූලධර්මයකි. යමක් පිළිබඳව ලිවීමේදී හැකි උපරිම මට්ටමටකට තමන්ගේ පසුබිම, අදාළ කාරණය ලිවීම සඳහා තමන්ව යොමුකරවන සාධකය, අදාළ සිද්ධිය සමග තමන්ගේ ඇති සම්බන්ධතාව, මූල්‍යමය අභිලාශයන් ආදී සියලු දේ පාඨකයන්ට හෙළිදරවු කිරීම ඉතාම වැදගත් වේ. (ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් ඇති සංකර්ණ අවස්ථාවලදී වාර්තාකරුවාගේ අනන්‍යතාව හෙළිදරවු කිරීම හෝ නොකිරීම පිළිබඳ කාරණය සමග මේ පාරදෘශ්‍ය භාවය පිළිබඳ මූලධර්මය පටලවා නොගත යුතුයි.)

පෞද්ගලික ලැදියාවන් සහ පක්ෂපාතිකම් අවිඥානිකව හෝ සවිඥානිකව ජනමාධ්‍යවේදීන් ලියන කියන දේ කෙරෙහි බලපාන බව අප පිළිගත යුතුයි. තමන්ට අතිශයින් සමීප කාරණා පිළිබඳව සටහන් කරන, ඇතැම් විට සංස්කාරකයෙකු නැති වෙබ් අඩවියක ට එම සටහන යවන පුරවැසි වාර්තාකරුවා මේ කාරණය ගැන බරපතල ලෙස සිහි තබා ගත යුත්තේ එහෙයිනි.

හැකි සෑම අවස්ථාවකම තමන් ලියන කතාවට අදාළ මූලාශ්‍ර වෙත පිවිසිය හැකි සම්බන්ධකයන් (Links) ලබා දීමෙන් සහ තමන් කියන දෙය සනාථ කිරීම සඳහා ඕනෑම කෙනෙකුට පහසුවෙන් සොයා බැලිය හැකි තොරතුරු ඇතුළත් කිරීමෙන් වාර්තාකරුවන්ට පාරදෘශ්‍යභාවය ආරක්ෂා කරගත හැකියි.

## ස්වාධීනත්වය

ආණ්ඩුවේ හෝ පෞද්ගලික හිමිකරුවන්ගේ හෝ අයිතිය යටතේ තිබෙන සාම්ප්‍රදායික මාධ්‍ය වල සේවය කරන ජනමාධ්‍යවේදීන්ගෙන් වෙනස්ව වෙබ් අඩවියකට නැතිනම් තමන්ගේම පෞද්ගලික බ්ලොග් එකකට ලියන පුරවැසි ජනමාධ්‍යකරුවාට දේශපාලන හෝ වාණිජ පීඩනයන්ගෙන් ස්වාධීනව වාර්තාකරණයේ නියැලිය හැකි බව බැලූ බැල්මට පෙනේ.

නමුත් මූල්‍යමය හෝ වෙනත් වරප්‍රසාද ලබා ගැනීම උදෙසා තම ජනමාධ්‍යවේදී තත්ත්වය පාවිච්චි කිරීමේ අවකාශය පුරවැසි වාර්තාකරුවන් වෙතද ඕනෑතරම් ඇති බව අමතක නොකළ යුතුය.

විශේෂයෙන්ම පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි විශාල වශයෙන් ජනප්‍රිය වී පුරවැසි වාර්තාකරුවන් පුරවැසි ජනමාධ්‍යවේදය වෘත්තිය මට්ටමින් කරන්නට පටන් ගත් විට ස්වාධීනත්වය හා බැඳුණු අභියෝගවලට මුහුණ දීමට සිදුවනු ඇත.

සාම්ප්‍රදායික ජනමාධ්‍යවේදය තුළ ඇති ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම පිළිබඳ උභතෝකෝටිකය මගහැරයාමේ විකල්පයක් ලෙස පුරවැසි ජනමාධ්‍ය සංකල්පයට විශාල වටිනාකමක් ලැබෙන බව මතකයේ තබා ගැනීම වැදගත් වෙයි. එම වටිනාකම අනාගතයේ ඇතිවිය හැකි අනපේක්ෂිත ප්‍රවණතා හමුවේ නොවෙනස්ව ආරක්ෂා කර ගැනීමට පුරවැසි මාධ්‍යවේදීන් කැප විය යුතුයි.

# විකල්ප වෙබ් අඩවියට පිවිස බැලුවාද?




*විකල්ප* ත්‍රෛභාෂික පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවිය ක්‍රම ක්‍රමයෙන් වැඩි වැඩියෙන් පාඨක පිරිස දිනාගනිමින් සිටින බව පෙනේ. විවිධ ප්‍රදේශවලින් පුරවැසි මාධ්‍යකරුවෝ තම කතා විකල්ප වෙත එවති.

*විකල්ප* සාර්ථක, බලපෑම් සහගත සැබෑ පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් කළ හැක්කේ ක්‍රියාකාරී පුරවැසියන්ගේ උනන්දුමත් දායකත්වය තුළිනි. ඔබේ ප්‍රදේශයේ ප්‍රවෘත්ති අපට ලියා එවන්න. පළ වී ඇති කතාවලට ඔබගේ ප්‍රතිචාර ලබා දෙන්න. විකල්ප ගැන ආරංචිය තැන තැන පතුරවන්න.

**www.vikalpa.org**

# තොරතුරු තාක්ෂණය පිළිබඳ තවත් වැඩමුළුවක් කුරුණෑගලදී.....



කුරුණෑගල වැඩමුළුවේ අවස්ථාවක්.....

ප්‍රජා සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය ඵලදායි ලෙස ඉවහල් කරගන්නේ කෙසේද යන්න අළලා එක්දින වැඩමුළුවක් කුරුණෑගල කාන්තා සංවර්ධන සමිතියේ සාමාජිකාවන් සමග 2007 අගෝස්තු 17 දින පැවැත්වුණා. සුනන්ද දේශප්‍රිය මහතා මේ වැඩමුළුව මෙහෙයවූවා.

වැඩමුළුවේ ආරම්භක සැසිය වූයේ පුරවැසි ජනමාධ්‍ය භාවිතාවයි. සාර්ථකව පුරවැසි කතාවක් ලියන්නේ කෙසේද යන්න ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් අත්හදා බැලුණා. ක්‍රියාකාරකම අවසානයේදී සහභාගි වූ අය තම තමන්ගේ කතා නිමවා තිබුණා. ඒවායින් සමහරක් විකල්ප වෙබ් අඩවියේ පළ වී තිබෙනවා.

මේ වැඩමුළු මාලාවේ දෙවැන්න සැප්තැම්බර් 31 වැනිදා කාන්තා සංවර්ධන පදනමේ පැවැත්වීමට නියමිතයි.

CPA
Centre for Policy Alternatives

පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන

මාධ්‍ය ඒකකය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 1 සී, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ - 07
දුරකථන අංක : 011-2375269, 011-2375012, ෆැක්ස් අංකය : 011-2375623
contributions@vikalpa.org, editor@vikalpa.org, info@vikalpa.org